<u>මනෝ ධර්ම සහ සිත් 89</u>

<u>25.09.2016 - ශ්‍රී ලංකාරාමය</u>

<u>නවසීලන්තය</u>

හැම දෙනාටම පරම ශාන්ත වූ නිර්වාණ ධාතුව අවබෝධ කරගන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. මේ කාරණයත් එක්ක තමයි අපි ධර්ම කරුණු ටික සිහිපත් කරන්නේ. මේ වචන තුන හොඳට තේරුම් ගන්න. හොඳට මතක තියා ගන්න.

- විඤ්ඤාණ <u>ධාතු</u>
- මනෝ <u>ධාතු</u>
- මනෝ විඤ්ඤාණ <u>ධාතු</u>

ගොඩක් අයට මේ කාරණයේ පටලැවෙන තැනක් තිබෙනවා. ඒ නිසා එම කාරණය පැහැදිලිව තේරුම් ගත්තොත් මේවා යෙදිලා තිබෙන තැන්වල ධර්ම කාරණය හොඳට තේරුම් ගන්න පුළුවන්.

මෙතැන වචන තුනක් තිබෙනවා. ඒ වචන වල <u>ධාතු</u> කියන වචනය සමානයි. **'ධාතු'** කියලා කියන්නේ සත්වයෙක් නොවන්නාවූ, පුද්ගලයෙක් නොවෙන්නාවූ, ආත්මයක් නොවෙන්නාවූ, ජීවයක් නොවෙන්නාවූ ධර්ම ස්වභාවයට. **'පඨවි ධාතු'** කියල කියන්නේ ඇයි? සත්වයෙක් නොවෙන්නාවූ පුද්ගලයෙක් නොවෙන්නාවූ දෙය නිසා. **'ආපෝ ධාතු'** කියලා කියන්නේ සත්වයෙක් පුද්ගලයෙක් ජීවයක් ආත්මයක් නොවෙන නිසා. සත්ව පුද්ගල ආත්ම නැති ධාතු ස්වභාවයකින් යම් කිසි ස්වභාවයක් දරාගෙන පැවතීමට කියනවා **'ධාතුව'** කියලා.

'විඤ්ඤාණය' කියන්නේ මොකක්ද? සිත. විඤ්ඤාණයට පුළුවන්කම තියෙන්නේ යම්කිසි අරමුණක් දැන ගැනීමේ මාත්‍රය පමණයි. මේ දැන ගැනීමේ ගතිය, දැන ගැනීමේ ස්වභාවය සත්වයෙක් නොවෙන නිසා පුද්ගලයෙක් නොවෙන නිසා ජීවයක්, කෙනෙක් නොවෙන නිසා ඒකට කියනවා **'විඤ්ඤාණ ධාතුව'** කියලා.

ඊළඟට තිබෙනවා **'මනෝ ධාතුව'**. **'මනෝ ධාතුවත්'** මනෝ ස්වභාවයක්මයි. ඒකත් හිතම තමයි, නමුත් ඒක යෙදෙන විදියක් තිබෙනවා. **'මනෝ'** කියන තැනත් සත්වයෙක් නෙවෙයි, පුද්ගලයෙක් නොවෙයි, ජීවයක් නොවෙයි.

'මනෝ විඤ්ඤාණ ධාතුව' කියන්නේ තව ටිකක් එහාට ගිය දෙයක්. ඒකෙත් තිබෙන්නේ 'වැඩිපුර දැනගන්නා ස්වභාවයක්'. **'මනෝ විඤ්ඤාණ ධාතුවත්'** සත්වයෙක් පුද්ගලයෙක් නොවන්නාවූ ස්වභාවයක්.

'විඤ්ඤාණ ධාතු', **'මනෝ ධාතු'**, **'මනෝ විඤ්ඤාණ ධාතු**' යන තුන වෙනස් වූ වචන තුනක් බව තේරුම් ගන්න ඕනේ.

දැන් මම මෙහෙම ලියනවා

1. **භවාංග** 2. **භවාංග චලන** 3. **භවාංග උපච්ඡේද** 4. **පංචද්වාරාවජ්ජන**
5. **චක්ඛු විඤ්ඤාණ** 6. **සම්පටිච්ඡන** 7. **සන්තීරණ** 8. **වොත්ථපන** 9. **ජවන**
10. **ජවන** 11. **ජවන** 12. **ජවන** 13. **ජවන** 14. **ජවන** 15. **ජවන**
16. **තදාරම්මණ** 17. **තදාරම්මණ**

ඉහත සඳහන් වන්නේ භවාංගයේ සිට අරමුණක් අල්ලාගෙන හිත ගමන් කරන හැටි පෙන්නුම් කරන චිත්ත වීථියක්. අරමුණක් පහළ වෙන අවස්ථාවේදී හිත තිබෙන්නේ භවාංගයේ. ඊට පස්සේ හිත, අරමුණ පැත්තට හැරිලා ඉහත සඳහන් ආකාරයට සිත් පෙළක් පහළ වෙලා ඒ ආරම්මණය ඩැහැ ගන්නවා. මේ චිත්ත වීථියට කියනවා **'පංචද්වාරාවජ්ජන චිත්ත වීථියක්'** කියලා.

මේ චිත්ත වීථිය බාහිර අරමුණක් සමබන්ධයෙන් වැඩ කරන චිත්ත වීථියක්ද නැත්නම් මනසේ තිබෙන අරමුණක් සමබන්ධයෙන් වැඩ කරන චිත්ත වීථියක්ද? බාහිර අරමුණක් සමබන්ධයෙන් වැඩ කරන එකක්.

ඇයි මෙහම දෙකක් ලියන්න හේතුව? ඇහෙන් හරි, කනෙන් හරි, නාසයෙන් හරි, දිවෙන් හරි, කයෙන් හරි මේ පස් දොරටුවෙන්ම එළියට ගිහිල්ලා අරමුණක් ගන්න චිත්ත වීථිය තමයි **'පංචද්වාරාවජ්ජන චිත්ත වීථිය'**.

'මනෝද්වාරික චිත්ත වීථි' වලින් කෙරෙන්නේ මතකයේ තිබෙන්නාවූ දේවල් දැන ගැනීම. එම චිත්ත වීථිය වැඩ කරන විදිය පහළින් සඳහන් වෙයි.

1. **භවාංග** 2. **භවාංග චලන** 3. **භවාංග උපච්ඡේද** 4. **මනෝ ද්වාරාවජ්ජන** 5. **ජවන** 6. **ජවන** 7. **ජවන** 8. **ජවන** 9. **ජවන** 10. **ජවන** 11. **ජවන** 12. **තදාරම්මණ** 13. **තදාරම්මණ** 14. **භවාංග** 15. **භවාංග** 16. **භවාංග** 17. **භවාංග**

'පංචද්වාරාවජ්ජන' චිත්ත වීථි තිබෙන විදියයි, **'මනෝද්වාරාවජ්ජන'** චිත්ත වීථි තිබෙන විදියයි වෙනස්. මේවායේ සමාන කමුත් තිබෙනවා. **'පංචද්වාරාවජ්ජන'** චිත්ත වීථි වල තිබෙන **'පංචද්වාරාවජ්ජන'** **'චක්ඛු විඤ්ඤාණ'** **'සම්පටිච්ඡන'** **'සන්තීරණ'** **'වොත්ථපන'** යන සිත් මනෝද්වාර චිත්ත වීථිවල නැහැ. මේ සිත් අවශ්‍ය වෙන්නේ පංචද්වාරාවජ්ජන චිත්ත වීථිවලට පමණයි. පංචද්වාරාවජ්ජන චිත්ත වීථි වලට අරමුණු වෙන්නේ අලුත් අලුත් අරමුණු බැවින් 'චක්ඛු විඤ්ඤාණ' 'සම්පටිච්ඡන' 'සන්තීරණ' 'වොත්ථපන' යන සිත් පංචද්වාරාවජ්ජන චිත්ත වීථි වලට අවශ්‍ය වෙනවා. ඒ සිත් ඒ විදියට අවශ්‍ය නිසා තමයි එහෙම පිහිටන්නේ.

මනෝද්වාරාවජ්ජන චිත්ත වීථියක භවාංග, භවාංග චලන, භවාංග උපච්ඡේද ඇතිවෙලා ඊළඟට මනෝද්වාරය පැත්තට හිත හරවන මනෝද්වාරාවජ්ජන සිත පහළ වෙනවා. ඊට පස්සේ ජවන් සිත් 7 ක් පහළ වෙනවා. ඊට පස්සේ තදාරම්මණ සිත් දෙකක් පහළ වෙලා නැවතත් භවාංග ඇති වෙනවා.

ගොයමක් හැදෙන කොට එක එක අවස්ථාවලදී එක එක නම් කියනවා. 'වී' වපුරලා ටික දවසක් යනකොට 'පැළ ගොයම' කියලා කියනවා. ඊට පස්සේ 'බණ්ඩි ගොයම' කියලා කියනවා. ඊට පස්සේ කියනවා 'කිරි වැදෙන ගොයම' කියලා. ඊට පස්සේ ගොයම් කපනවා. ගොයම් කැපුවට පස්සේ ඒකට කියනවා

'ගොයම් කොළේ' කියලා. ඊට පස්සේ ඒවායින් 'වී' ගන්නවා. ඒ වී වලට කියනවා 'බැත' කියලා. ඉතුරු කොටසට කියනව 'පිදුරු' කියලා. වී කෙටුවට පස්සේ 'හාල්' බවට පත්වෙනවා. හාල් 'බත්' බවට පත්වෙනවා. දැන් පේනවා නේද වචන වෙනස් වෙන තාලේ. ඒවගේ, යම් යම් දේවල් සිද්ධ කරන කොට ඒ තැනේ හැටියට ඒ ඒ දේවල් වල නම වෙනස් වෙනවා. මෙසේ නම වෙනස් වීම ස්වභාවයක්.

ළමයින්ට පොඩි කාලේ පොදුවේ කියනවා ළදරුවෝ (ළා දරුවෝ) කියලා. ඊළඟට කියනවා බබා කියල කියනවා. බේබි කියලත් කියනවා. ඒකෙත් නුගේගොඩින් කොළඹ පැත්තට වෙන්න, බත්තරමුල්ලෙන් කොලඹ පැත්තට වෙන්න, කිරිබත්ගොඩින් කොළඹ පැත්තට වෙන්න ඉන්න කට්ටිය ඔක්කොම බබාලා. කිරිබත්ගොඩින් එහාට, මීගමුව පැත්තෙන් එහාට ගියාට පස්සේ ඔක්කොම කොල්ලෝ. එහෙම තියෙනවා නේද? ඒවගේම ඒ බබාලා කොලඹ 5, 7 වගේ යනකොට බේබිලා වෙනවා. ඒ ගොල්ලෝ විවාහ වෙලා ලොකු අප්පච්චිලා උනත් තාමත් බේබිලා. එහෙම තියෙනවා. දැන් බලන්න නම් වෙනස් වෙන හැටි. පොඩි කාලෙදි අපිට 'ළදරුවෝ' කියනවා. ඊට පස්සේ 'ළමයා' කියනවා. ඊට පස්සේ 'තරුණයා' කියනවා. 'ගැටවරයා' කියලා කියනවා. ඊට පස්සේ 'මනුස්සයා' කියනවා 'කාන්තාව' කියලා කියනවා. ඊළඟට 'අම්මා' 'තාත්තා' කියනවා. ඊට පස්සේ ඔහොම ගිහිල්ලා 'ආච්චි' කියනවා, 'සීයා' කියනවා.

දැන් බලන්න මේ හිත් පේළි වලට දීලා තිබෙන නම්. හිත් පේළියක් අරමුණක් සබන්ධයෙන් ක්‍රියාත්මක වෙමින් යනකොට ඒකට කියන්නාවූ නම් තමයි ඔය කිව්වේ. හැබැයි ඒ හැම සිතක්ම එකම අරමුණක් සම්බන්ධයෙන් වැඩ කරාට, ඒ සිත් වල ක්‍රියා කාරී ස්වභාවය වෙනස්. ළමයෙක් ළදරු කාලේ වැඩ කරන විදියයි, ළමා කාලේ වැඩ කරන විදියයි, තරුණයා වැඩ කරන විදියයි, වැඩිහිටියා වැඩ කරන විදියයි වෙනස්. ළමයා පොඩි කාලෙදි දෙන දෙයක් කාල නට නටා ඉන්නවා. ඊට පස්සේ ඇවිදිනවා, සෙල්ලම් කරනවා, ඊට පස්සේ තව ටිකක් වැඩෙන කොට ඉස්කෝලේ යනවා. ඉගෙන ගැනීමක් තිබෙනවා. ඊළඟට උසස් අධ්‍යාපනයට යනවා. ඊළඟට රස්සාවල් කරනවා. එහෙම තියෙනවනේ. එකම කෙනා ජීවිත ගමන යනකොට තැන් තැන් වලදී එයාට ලැබෙන්නාවූ අරමුණුත් එයා එක්ක වෙනස් වෙනවා.

ඒවගේම තමයි චිත්ත වීථියක සෑම සිතක්ම වැඩ කරන්නේ අරමුණක් සම්බන්ධව තමයි. නමුත් ඒ හැම සිතක්ම ඒ අරමුණ සම්බන්ධයෙන් වෙනස් වෙනස් ක්‍රියාවල් තමයි කරන්නේ. මේවා සත්ව නොවෙන ජීව නොවෙන දේවල්.

'පංච ද්වාරාවජ්ජන' චිත්ත වීථියක

1. **භවාංග**

2. **භවාංග චලන** — **මේ තුනම භවාංගයට සම්බන්ධ තැන්**

3. **භවාංග උපච්ඡේද**

ඉස්සෙල්ලාම භවාංග ස්වභාවය වෙනස්වෙලා බිඳිලා ගිහිල්ලා අරමුණට හැරෙන තැන තමයි 'පංචද්වාරවජ්ජන සිත' කියලා කියන්නේ.

4. **පංචද්වාරවජ්ජන සිත** = **(මනෝ ධාතු)** මේ සිතට 'මනෝධාතු' කියල කියනවා. හැබැයි මේ සිතට අරමුණ දැන ගන්නවත් අරමුණ ගැන හිතා බැලීමේ හැකියාවක්වත් මොකක්වත් නෑ. ගේට්ටුවකින් ඇතුල් වෙනවා වගේ ස්වභාවයක් තමයි තිබෙන්නේ.

5. **චක්ඛුවිඤ්ඤාණ** = **(විඤ්ඤාණ ධාතු)** මේ සිතගාවට එනකොට හරියටම ආරම්මණය ස්පර්ශ වෙලා පිංතූරයක් ගන්නවා වගේ දෙයක් වෙනවා. එහිදී වර්ණය පමණක් හඳුනා ගන්නවා.

6. **සම්පටිච්ඡන** = **(මනෝ ධාතු)** චක්ඛුවිඤ්ඤාණයෙන් ගත් ඒ අරමුණ තමන්ගේ පැත්තට නමා ගැනීමක්, හරවා ගැනීමක් වගේ දෙයක් සිද්ධ වෙන නිසා ඒ සිතට කියනවා පිළිගැනීමේ සිත කියලා. හැබැයි ඒකටත් වැඩි යමක් කරන්න බෑ. මේ සිතටත් කියනවා 'මනෝ ධාතු' කියලා.

7. සන්තීරණ = **(මනෝ විඤ්ඤාණ ධාතු)** සම්පටිච්ඡන සිතෙන් බාර ගත්තු අරමුණ ගැන සිතා බලන ගතියක්, හොයා බලන ගතියක්, විමසා බලන ගතියක් තිබෙන නිසා මනෝ ධාතුවට වඩා වැඩියෙන් වැඩ කරන ගතියක් මේ සිතේ තිබෙනවා. මේ සිතට කියනවා 'මනෝ විඤ්ඤාණ ධාතු' කියලා.

8. වොත්ථපන = **(මනෝ විඤ්ඤාණ ධාතු)**

9. ජවන් = **(මනෝ විඤ්ඤාණ ධාතු)**

10. ජවන් = **(මනෝ විඤ්ඤාණ ධාතු)**

11. **ජවන්** = **(මනෝ විඤ්ඤාණ ධාතු)**

12. **ජවන්** = **(මනෝ විඤ්ඤාණ ධාතු)**

13. ජවන් = **(මනෝ විඤ්ඤාණ ධාතු)**

14. ජවන් = **(මනෝ විඤ්ඤාණ ධාතු)**

15. ජවන් = **(මනෝ විඤ්ඤාණ ධාතු)**

16. තදාරම්මණ

17. තදාරම්මණ

දැන් හොඳට තේරුම් ගන්න මේ කාරණය. දැන් මෙතන හිත් වෙනස් උනේ නෑ. හැබැයි ඒ සිත්වල තිබෙන්නාවූ ක්‍රියා කාරී ස්වභාවය වෙනත් වචන වලින් කථා කරනවා. 'බැත' කියලා කිව්වත් 'වී' කියලා කිව්වත් දෙකම එකයි. ඒක ගහේ තිබෙන කොට 'කිරි වදින ගොයම' කියලා කියනවා. 'වී ඇට' හැදෙනකොට 'බණ්ඩි' කියලා කියනවා. 'වී' කෙටුවට පස්සේ 'හාල්' කියනවා. තැම්බුවායින් පස්සේ 'බත්' කියලා කියනවා.

මේ විදියට මේ චිත්ත වීථියේ **'මනෝධාතු'** තිබෙනවා, **'විඤ්ඤාණධාතු'** තිබෙනවා, **'මනෝ විඤ්ඤාණ ධාතු'** තිබෙනවා. මෙතන වැඩි පුර කොටසක් කෙරෙන්නේ මොනවැයින්ද? **'මනෝ විඤ්ඤාණ ධාතු'** වලින් ටිකක් වැඩිපුර අරමුණ සම්බන්ධයෙන් හොයල බලන ගතියක් තිබෙනවා.

'මනොද්වාර' චිත්ත වීථියක් ගත්තහම

1. **භවාංග**
2. **භවංග චලන**
3. **භවාංග උපච්ඡේද**

මේ තුනම භවාංගට සම්බන්ධයි

4. **මනෝ ද්වාරාවජ්ජන = මනෝ විඤ්ඤාණ ධාතු**
5. **ජවන = මනෝ විඤ්ඤාණ ධාතු**
6. **ජවන = මනෝ විඤ්ඤාණ ධාතු**
7. **ජවන = මනෝ විඤ්ඤාණ ධාතු**
8. **ජවන = මනෝ විඤ්ඤාණ ධාතු**
9. **ජවන = මනෝ විඤ්ඤාණ ධාතු**
10. **ජවන = මනෝ විඤ්ඤාණ ධාතු**
11. **ජවන = මනෝ විඤ්ඤාණ ධාතු**
12. **තදාරම්මණ**
13. **තදාරම්මණ**
14. **භවාංග**
15. **භවාංග**
16. **භවාංග**
17. **භවාංග**

ජවන් වලට **'මනෝ විඤ්ඤාණ ධාතු'** කියලා කියන්න හේතුව ජවන් වල අරමුණ සම්බන්ධව ටිකක් වැඩිපුර හිතන, බලන, හොයන, අරමුණේ රස වින්දනය කරන ගතියක් තිබෙන නිසා. ඒක නිසා ජවන් සිත් ඔක්කොම **'මනෝ විඤ්ඤාණ ධාතු'** වෙනවා.

සිත් ඔක්කොම කියක් තිබෙනවද? සිත් 89. මේ සිත් 89 තුල විඤ්ඤාණ ධාතු තිබෙනවා 10ක්.

<u>අකුසල විපාක</u> - චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ

+

<u>කුසල විපාක</u> - චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ, ඝාන විඤ්ඤාණ, ජිව්හා විඤ්ඤාණ, කාය විඤ්ඤාණ

} විඤ්ඤාණ ධාතු 10

මෙම සිත් 10 'අරමුණ දැන ගන්නා' මාත්‍ර ස්වභාව තිබෙන නිසා **'විඤ්ඤාණ ධාතු'** කියල කියනවා. මේ විඤ්ඤාණ ධාතු 10 කොහෙද තියෙන්නේ? 'අහේතුක සිත්' ගොඩේ තිබෙන්නේ.

මුළු සිත් ගණන 89 - විඤ්ඤාණ ධාතු 10 = සිත් 79

මෙහි **'මනෝ ධාතු 3'** ක් තිබෙනවා. එනම්

පංචද්වරාවජ්ජන + කුසල සම්පටිච්ඡන + අකුසල සම්පටිච්ඡන = මනෝධාතු 3

සිත් 89 න් විඤ්ඤාණ ධාතු 10 ත් මනෝ ධාතු 3 අඩු උනහම ඉතිරි සිත් 76 ම **'මනෝ විඤ්ඤාණ ධාතු'** නම් වෙනවා.

සිත් 89 - (විඤ්ඤාණ ධාතු 10 + මනෝ ධාතු 3) = 76 (මනෝ විඤ්ඤාණ ධාතු)

'මනෝධාතු' වැඩ කරන්නේ මොන චිත්ත වීථියේද? **'මනෝධාතු'** වැඩ කරන්නේ **'පංචද්වාරවජ්ජන'** චිත්ත වීථියේ.

'මනෝද්වාර' චිත්ත වීථිවල තිබෙන්නේ **'මනෝ විඤ්ඤාණ ධාතු'**.

'පංචද්වාරවජ්ජන' චිත්ත වීථියේ 'චක්ඛු විඤ්ඤාණයට' කලින් තිබෙන්නාවූ පංචද්වාරවජ්ජන සිතත් **'මනෝධාතුවක්'** - 'චක්ඛු විඤ්ඤාණයට' පස්සේ

තිබෙන සම්පටිච්ඡන සිතත් **'මනෝධාතුවක්'**. මේ **'මනෝධාතු'** වල කර්ම රැස් වෙන්නේ නෑ. 'චක්ඛු විඤ්ඤාණයට' කලින් තිබෙන්නාවූ 'පංචද්වාරවජ්ජන සිත' **'ක්‍රියා මාත්‍ර සිතක්'** පමණයි. 'චක්ඛු විඤ්ඤාණයට' පස්සේ තිබෙන 'සම්පටිච්ඡන සිත' **'විපාක සිතක්'**. මේක තමයි මේ සිත් දෙකේ තිබෙන වෙනස. ඒක ක්‍රියා හෝ වේවා විපාක හෝ වේවා මේ සිත් දෙකටම කියන්නේ **'මනෝධාතු'** කියලා.



'පට්ඨානය' ඉගෙන ගැනීමේදී මේ ටික දැනගෙන තිබෙන්න ඕනේ. 'පට්ඨානය' ඉගෙන ගැනීමේදී අපි චිත්ත වීථිගැන ගොඩක් දිගට කථා කරන්නේ නෑ. ඒකෙ තිබෙන්නාවූ ස්වභාව ධර්ම හඳුනාගෙන තමයි අපි කථා කරන්නේ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස මනෝද්වාරික චිත්ත වීථියේ අන්තිම සිත් හතර භවාංගමද?

<u>පිළිතුර</u> - භවාංගමයි, ඒ චිත්ත වීථිය තදාරම්මණ වලින් ඉවරයි. ඒ උනාට චිත්ත වීථියේ අංග 17 සම්පූර්ණ කිරීම නිසා භවාංග ටිකක් දාල තිබෙන්නේ. නැත්නම් 13 ඉවරයි.

<u>ප්‍රශ්නයක්</u> **-** ස්වාමීන්වහන්ස එතකොට සිත් පහළ වෙන්න ඉස්සෙල්ලා තිබෙන භවාංග, භවාංග චලන, භවාංග උපච්ඡේද කියන ඒවා සිත්වලට අයිති වෙන්නේ නැත්ද?

<u>පිළිතුර</u> **-** ඒවා වීථි සිත් වල ප්‍රාථමික අවස්ථාව මතක් කරන්න කථා කළාට වීථි සිත් කියලා ගණන් ගන්නකොට ගණන් ගන්නේ භවාංග උපච්ඡේදයෙන් පස්සේ. පංචද්වාරාවජ්ජනයේ ඉඳල තදාරම්මණය දක්වා තමයි අරමුණක් සම්බන්ධයෙන් තදින් වැඩ කරන්නේ. දැන් කෙනෙක් ගමනක් යන්න යන කොට එයා ගෙදරින් එළියට අඩියක් තිබ්බ වෙලාවේ ඉඳල තමයි ගමන යනවා කියලා කියන්නේ. ගෙදරදී ඉතින් මූණ හෝදනවා, ඇඳුම් අඳිනවා, ඒ වගේ ඒවා කරනවා නමුත් තවම ගමන පටන් ගත්තේ නැනේ. ඒවගේ, ගමන යනවා කියන්න නම් පඩියෙන් එළියට බහින්න ඕනේ.

<u>ප්‍රශ්නයක්</u> **-** ස්වාමීන්වහන්ස අරමුණක් දැන් ගන්න අවස්ථාව කියන්නේ ..... මනෝ විඤ්ඤාණ ධාතු දෙකක් තියෙනවනේ එතන?

<u>පිළිතුර</u> **-** 'චක්ඛු විඤ්ඤාණ ධාතුව' තමයි රූපය ඉස්සෙල්ලාම වද්දා ගෙන අරමුණ දැන ගන්නා සිත.

ඊට පස්සේ චක්ඛු විඤ්ඤාණ ධාතුවෙන් ගත්තු අරමුණ 'බාර ගැනීමේ සිත' නම් වූ **'සම්පටිච්ඡන'** සිතෙන් කරන්නේ 'මේ ආගන්තුකයෙක් ඇවිල්ලා ඉන්නවා' කියල කියන්න වගේ ඒ අරමුණ පිළිගන්නවා.

කවුරු හම්බ වෙන්නද ආවේ, කොහේ ඉඳලද අවේ කියලා අහලා බලනවා වගේ ඒ බාර ගත්තු දේ කුමක්ද කියලා හොයා විමසා බලන සිත **'සන්තීරණ'** සිත.

ඊට පස්සේ ඒ ආපු කෙනා හොඳ මනුස්සයෙක් කියලා තීරණය කරනවා වගේ ඒ ගත්තු අරමුණ හොඳයි වශයෙන් හෝ නරකයි වශයෙන් තීරණය කරන්නාවූ හිත තමයි **'වොත්ථපන'** සිත.

එහෙම තීරණය උනාට පස්සේ තමයි ජවන් වලින් ජවන කෘත්‍ය සිදු කරන්නේ. මේ විදියට තීරණය කරන, හොයා බලන සිත්වලට වැඩ වැඩියි. ඒක නිසා 'විඤ්ඤාණ ධාතුවට' වඩා 'මනෝ විඤ්ඤාණ ධාතුවට' ටිකක් කාර්ය බහුල ගතියක් තිබෙනවා.

මේ විදියට පංචද්වාරාවජ්ජන සිතකින් ගත්තු අරමුණක් අපේ හිතේ වදිනවා. ඊට පස්සේ අපි ඇස් දෙක පියාගෙන ඒ බලාපු දෙයක් ගැන, දැකපු දෙයක් පිළිබඳව හිතනවා. එහෙම දැකල බලල තියෙන දේවල් ගැන නැවත හිතන්න **'සම්පටිච්ඡන'** සිත් එහෙම අවශ්‍ය නෑ. ඒවා ගැන හිත හිතා **'මනෝ විඤ්ඤාණ ධාතු'** සිත්වලින් විමසා බලමින් රස විඳිනවා. එහෙම ක්‍රියාවක් තමයි **'මනෝ විඤ්ඤාණ ධාතු'** වල තිබෙන්නේ.

ප්‍රශ්නයක් - ස්වාමීන්වහන්ස, සම්පටිච්ඡන සිත විපාක සිතක්. සන්තීරණ වොත්තපන කියන සිත් මොන සිත් වලටද වැටෙන්නේ?

පිළිතුර - සන්තීරණ සිත විපාක සිතක්. වොත්තපන සිත ක්‍රියා සිතක්.

දැන් අපි **'විඤ්ඤාණ ධාතු'** කියල කිව්වා, **'මනෝ ධාතු කියල'** කිව්වා, **'මනෝ විඤ්ඤාණ ධාතු'** කියලා කිව්වා. ඔක්කොම 'විඤ්ඤාණ ධාතු' කීයක් තිබෙනවද? 10 තිබෙනවා.

ඒ මොනවාද? චක්ඛු විඤ්ඤාණ - සෝත විඤ්ඤාණ - ඝාන විඤ්ඤාණ - ජිව්හා විඤ්ඤාණ - කාය විඤ්ඤාණ යන පහ කුසල් සහ අකුසල් වශයෙන්.

මනෝ ධාතු කීයක් තිබෙනවද? තුනයි, පංචද්වාරාවජ්ජන සිත සහ සම්පටිච්ඡන සිත් දෙක (අකුසල් සහ කුසල් වශයෙන්).

අනිත් සිත් 76 මනෝ විඤ්ඤාණ ධාතු. මේ සිත් මනෝ ධාතුවටත්, විඤ්ඤාණ ධාතුවලටත් වඩා වැඩියෙන් යමක් කරන්නාවූ සිත් බැවින් මේවා අනිත් ඒවාට වඩා වෙනස්.

මේ මනෝ ධර්ම එකට පිණ්ඩනය වෙලා තිබෙන්නේ. එකට ගුලිවෙලා තිබෙන්නේ. ඒවා වෙන වෙන ධර්මස්වභාව. ඒවා වෙන් කරලා දැන ගත්ත ගමන් අපි ගැට ගැහිලා ඉන්න සමූහ ප්‍රඥප්තියෙන් ගැලවිලා යනවා. අපිට

තිබෙනවා නොයෙකුත් ප්‍රඥප්ති, සටහන් වශයෙන් සහ සමූහ වශයෙන්. අපිට ඝන සංඥාව තිබෙනවා. අපි ප්‍රඥප්තියක් පණවන්නේ එක set එකක් ලොකුවට අරගෙන. අපි ගහක් කියලා ගන්නේ, ඒ ගහේ අතු පොතු කොළ කඳ මුල් ආදිය ඔක්කොම එකට අරගෙන තමයි ගහ කියන ප්‍රඥප්තිය දාගන්නේ. අපි රණ්ඩු සරුවල් වෙන්නේ ඒ ගහේ පොත්තේ පාටටවත් ඒකෙ තද ගතියටවත් නෙමෙයි. ඒකෙ තියෙන සම්භාරයම එකට අරගෙන අපි ඒකට ප්‍රඥප්තියක් දානවා. ගහ කියලා දානවා. ගෙදරටත් ඒ වගේ. පස්සේ අපි ඒවාට බැඳෙනවා. ඊට පස්සේ ඒවා ලිහා ගන්න තේරෙන්නේ නැහැ. ඒවා ලිහලා දැම්මට පස්සේ ‘මගේ’ කියලා බාර ගන්නේ නෑ. එතකොට කරදර අඩුයි. අපි හැම එක්කෙනාම තිබෙනවා අපිට අයිති නැති කොටස් නමුත් අපි අයිතිකර ගත්තු.

උදාහරණයක් වශයෙන් ‘අහස’ ගැන හිතන්න බලන්න. අහස කියලා කියන්නේ පඨවි, අපෝ, තේජෝ මොකවත් නැති තැනක්. ඉතිං ඒක ඕනෑම එක්කෙනුකට පාවිච්චි කරන්න පුළුවන්. එතන මොකක්වත් නැනේ. ඒකෙ ඕන කෙනෙකුට යන්නත් පුළුවන් එන්නත් පුළුවන්. අපේ කනේ සිදුරක් තිබෙනවනේ. ඒ සිදුර කියලා කියන්නේ මොකක්ද? අවකාශය. ඔතන එක්කෙනෙක් ඇවිල්ලා ගිනි කූරක් පත්තු කරනවා කියලා හිතමු. අහස ඇවිල්ලා කාටත් පොදුයිනේ. හැබැයි අපි එහෙම කරන්න දෙන්නේ නෑ. ඒ අහස කෑල්ල මගේ නිසා. නාසයෙත් ඒ වගේ. ඒ වගේ අපි, අපිට අයිති නැති ඒවා උනත් සමූහ අර්ථය නිසා අපිට අයිති එකක් හැටියට බාර අරගෙන තියෙනවා. නමුත් මේ ධර්ම ස්වභාව මෙනෙහි කරනකොට ඒ තියෙන ප්‍රශ්න ගැලවිලා යනවා.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස රහතන් වහන්සේ කෙනෙකුට විපාක සිත් නෑ, ක්‍රියා සිත් විතරයි තියෙන්නේ.. ඒක කොහොමද තේරුම් ගන්නේ?

<u>පිළිතුර</u> - රහතන්වහන්සේට විපාක සිත් තිබෙනවා. ජවන් සිත් විතරයි ක්‍රියා සිත් වෙන්නේ. රහතන්වහන්සේගේ භවාංග හිතත් ‘විපාකයි’. රහතන්වහන්සේගේ චක්ඛු විඤ්ඤාණයත් ‘විපාකයි’. රහතන්වහන්සේට පහළ වෙන්නාවූ සම්පටිච්ඡනයත් ‘විපාක’ සිතක්. හැබැයි රහතන්වහන්සේට පහළ වෙන ඔක්කොම ජවන් සිත් ‘ක්‍රියා සිත්’.

<u>රූපායතනය</u>

ඉහත සඳහන් රූපයේ තිබෙනවා ගහක්. ඒකට වර්ණයක් තිබෙනවා. ඒ 'වර්ණ සටහනට' අපි වෙන නමක් දානවා. දැන් මේ ගහ දිහා බලාගෙන ඉන්න එක්කෙනාගේ හිතේ පහළ වෙනවා සිත් ටිකක්. මෙයාගේ ඇහැ හැප්පෙනවා ඒ ගහේ තිබෙන වර්ණ රූපයේ. ඒ වර්ණ රූපයට අපි කියනවා **'රූප ආයතනය'** කියලා. වර්ණ රූපය කියලා එතැනදී පාවිච්චි කරන්නේ නෑ. ඇයි වර්ණ රූපයට **'රූප ආයතනය'** කියලා කිව්වේ? හේතුව, ඒ වර්ණ රූපය අරමුණක් හැටියට මේ මනුස්සයාගේ ඇහේ හැප්පිලා ඒ හරහා ගිහිල්ලා මේ මනුස්සයාට හිත් පහළ කරනවා, චෛතසික පහළ කරනවා. එක එක සිතුවිලි පහළ වෙලා කෙලෙස් හදලා දෙන නිසා ඒ වර්ණ රූපයට කියනවා **'රූප ආයතනය'** කියලා. දැන් **'රූපායතනය'** ආව, කෙලින්ම ඇහැට වැදුනා. ඊට පස්සේ පහළ වෙනවා 'චක්ඛු විඤ්ඤාණ ධාතුව'. 'චක්ඛු විඤ්ඤාණයේ' චෛතසික කීයක් තිබෙනවද? ඒකෙ තිබෙනවා චෛතසික ධර්ම 7 ක්. හැම චක්ඛු විඤ්ඤාණ ධාතුවකම තිබෙන්නේ චෛතසික ධර්ම 7යි. **'ඵස්ස'** **'වේදනා'** **'සංඥා'** **'චේතනා'** 'ඒකාග්‍රතා' **'ජීවිතේන්ද්‍රිය'** **'මනසිකාරය'**. 'චක්ඛු විඤ්ඤාණය' නම් වූ සිත තුල තිබෙන චෛතසික ධර්ම වලට කියනවා **'සම්ප්‍රයුක්ත ධර්ම'** කියලා.

මනුස්සයාගේ හිතේ චක්ඛු විඤ්ඤාණයකුත් සම්ප්‍රයුක්ත ධර්ම ටිකකුත් පහළ වෙන්න අරමුණක් හැටියට බලපෑවේ මොකක්ද? ගහේ වර්ණය. මේ වර්ණයේ බලපෑම නිසා කියනවා **'රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො'** කියලා.

දැන් බලන්න මේ ගහේ තිබෙනවා 'මාව අරමුණු වේවා' කියල කියන්නා වගේ ගතියක්. පැතීමක් නෙමෙයි නමුත් තමන්ව අරමුණු වෙන්න, හිතට ගැටෙන්න, චක්ඛු ද්වාරය හරහා ගිහිල්ලා කෙනෙකුගේ හිතේ සිත් ටිකකුත් චෛතසික ටිකකුත් පහළ කරන්න පුළුවන් ගතියක්, අරමුණක් හැටියට උපකාර වීමේ එක්තරා ගති ස්වභාවයක් ඒ ගහේ පාටට තිබෙනවා. ඔන්න ඕක නිසා පොතේ තිබෙනවා භාෂාව වෙනස් කරලා පද පේළියක්. ඒ තමයි **'රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො'.**

මේ සජ්ඣායනාවේ තිබෙනවා හිතට අදහස කැවීයන, අර්ථය මෙනෙහි වෙන, අර්ථයට හිත බැහැ ගන්න සජ්ඣායනාවක් තිබෙනවා. ඒ විදියටයි ඕක සජ්ඣායනා කල යුතුවෙන්නේ. මෙහි **'ප්‍රත්‍යය'** කියලා කියන්නේ **'උපකාර'** වෙනවා කියන එකයි. ඒ උපකාර භාවය තිබෙන්නේ <u>ඇහැට නොවෙයි</u>. ඇහැ හරහා ගන්න **'චක්ඛු විඤ්ඤාණයට'. 'චක්ඛු විඤ්ඤාණය'** කියන එක සත්ව පුද්ගල හැටියට හඳුනන්නෙ නැතුව එතන 'සත්වයෙක් නැති' එක්තරා ධාතු ස්වභාවයකටයි මේ 'ආරම්මණ ප්‍රත්‍යය' වෙන්නේ කියන එකයි මේකෙන් කියවෙන්නේ. මෙතන චෛතසික සමබන්ධ කිසිවක් කියන්නේ නෑ. මෙතනදී චෛතසික ධර්ම හඳුන්වන්නේ **'සම්ප්‍රයුක්ත ධර්ම'** කියලා. ඒ කියන්නේ **'එකට යෙදී තිබෙන ධර්ම'** කියන එකයි. එහෙම එකට යෙදී තිබෙන්නේ මොකක් එක්කද? චක්ඛු විඤ්ඤාණ ධාතුවටයි සම්ප්‍රයුක්ත ධර්ම සියල්ලටමයි රූපායතනය, ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන්නේ.

අපි මේක හොඳට තේරුම් ගන්නත් ඕනේ. මෙතන තිබෙනවා රූපායතනයේ බලපෑමෙන් ඇතිවෙන ධර්මතා 8 ක්. ඒ තමයි **චෛතසික ධර්ම 7 සහ සිත.** මේ චෛතසික ධර්ම වල තිබෙනවා **'සපර්ශය'** කියලා එකක්. ආරම්මණය කියන මේ වර්ණය 'මගේ ඇහේ ඇවිල්ලා හැප්පියන් කියන්න වගේ' ඔහේ ඉන්නවා. එතකොට සපර්ශය කරන්නේ ගිහිල්ලා ඒ වරණයේ හැප්පෙනවා. (ස්පර්ශයට හැප්පෙන්න දෙයක් තියෙන්නේ ඕනේ) ඊළඟට **'වේදනාව'** කරන්නේ මොකක්ද, ඒ අරමුණේ තිබෙන්නාවූ පාට හරි මොකක් හරි විඳ ගන්නවා. **'සංඥාව'** කරන්නේ වර්ණය හඳුනා ගන්න, සටහන් කරගන්න එක. **'චේතනාව'** කරන්නේ මේ ඔක්කොම එකට හසුරුවන එක. **'ඒකාග්‍රතාවය'**

මේ හිතයි චෛතසික ටිකයි ඔක්කොම 'වෙන ගහක හැප්පෙන්න එපා මේකෙම හිටීවා කියලා' යොමු කරනවා. **'ජීවිතේන්ද්‍රිය'** කරන්නේ ශක්තිය දෙනවා සියල්ලටම මේ ක්‍රියාවන් සිද්ධ කරන්න. **'මනසිකාරය'** කරන්නේ ඒ පැත්තට යොමු කරන එක. දැන් වැඩ 7 ක් තිබෙනවා. හැම චෛතසිකයක්ම මේ අරමුණ සම්බන්ධයෙන් යම්කිසි වැඩක් කරනවා. හිත කරන්නේ මේ ඔක්කොම support එක අරගෙන ගිහිල්ලා අරමුණ දැන ගන්න එක.

දැන් මෙතන වැඩ කීයක් තිබෙනවද? වැඩ 8 ක් තිබෙනවා. මේ වැඩ අටෙන් එකක් චක්ඛු විඤ්ඤාණයෙන්ද ඉතිරි වැඩ හත චෛතසික ධර්ම වලින්ද කරනවා. මේ වැඩ 7 ක්‍රියාත්මක කරවන්න මේ ගොල්ලෝ පණ ගස්සන්න, busy කරවන්න මේ රූපායතනය බලපෑමක් කළා නේද අරමුණක් හැටියට? ගහ එක තැනක තිබෙනවා. ගහට ඉස්සරහෙන් කෙනෙක් ඉන්නවා, නමුත් ගින්කුර පත්තු උනා වගේ ක්‍රියා ධර්ම 8ක් එයාගේ හිතේ ඇති උනා. දැන් තේරෙනවා නේද, **'රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො'** කියන සිද්ධිය වෙන්නේ ඔය විදියට.

<u>සද්දායතනය</u>



හොඳයි දැන් දෙවෙනි එක. ඉහත සඳහන් රූපයේ පෙනෙන කෙනා මඟුල් ගෙදරක ගිහිල්ලා ඉන්න එක්කෙනෙක්. එයා පරණ හින්දි සිංදුවක් අහනවා. දැන් එයාට ඒ සද්දේ ඇහෙනවා. ඒ සද්දෙට කියනවා **'සද්දායතනය'** කියලා. ශබ්දයටත් මේ 'ආයතන' වචනය පාවිච්චි කරන්න හේතුව මොකක්ද? හේතුව

තමයි, ඒ සද්දයට පුළුවන් මේ නිකම්ම නිකන් පාඩුවේ හිටපු මනුස්සයගේ කන තිබෙන හරියේ හැප්පිලා එයාගේ හිතේ **'ඵස්ස' 'වේදනා' 'සංඥා' 'චේතනා' 'ඒකාග්‍රතා' 'ජීවිතේන්ද්‍රිය' 'මනසිකාර'** කියන චෛතසික ධර්ම 7 පහළ කරනවා. හිතත් සමග ඔක්කොම ධර්මතා 8 ක් පහළ වෙනවා. හිතට පුලුවන්ද අර සද්දයේ ගිහිල්ලා හැප්පෙන්න? හිතට බෑ.   කවුද මේ හිතයි අනිත් ටිකයි ශබ්දය වෙත අරගෙන යන්නේ? 'සපර්ශය'. 'ස්පර්ශය' කරන්නේ හිතයි අනිත් චෛතසික 6 ගෙනිහිල්ල ශබ්දයෙහි හප්පනවා. 'සංඥාව' ශබ්දය හඳුනා ගන්නවා. 'වේදනාව' ශබ්දයේ තිබෙන්නාවූ රසය දැනගන්නවා. 'මනසිකාරය' සිතත් සම්ප්‍රයුක්ත ධර්මත් අනිත් ශබ්ද වලින් වෙන්කොට ඒ ශබ්දයෙහිම තබා ගන්නවා. 'ඒකාග්‍රතාවය' කරන්නේ සිතයි චෛතසික සියල්ලම එම ශබ්දය අත නොහැර පවත්වා ගැනීමට උදව්කරනවා. ජීවිතේන්ද්‍රිය ඒ සියල්ලටම ශක්තිය දෙනවා. චේතනාව අනිත් ඔක්කොම manage කරගෙන වැඩ කරනවා. දැන් මෙතන ශබ්දයට සම්බන්ධව වැඩ 8 ක් කෙරෙනවා.

දැන් මේ හොඳට හිටපු මේ මනුස්සයාගේ හිතේ, හිතයි, චෛතසික ටිකයි ගින්දරක් වගේ හදලා දාන්න හේතු උනේ මොකක්ද? ශබ්දය. ඒක නිසා කියනවා 'ශබ්දය ආයතනයක්' කියලා. ඊළඟට කන හරියේ පහළ වෙනවා ඒ ශබ්දය දැනගන්නාවූ 'සෝත විඤ්ඤාණ ධාතු'. ඒකට කියනවා 'විඤ්ඤාණ ධාතුව' කියලා. ඒකෙ ඇතුලේ තිබෙන ධර්ම වලට කියනවා 'සම්ප්‍රයුක්ත ධර්ම' කියලා. ඒ 'ශබ්දය' මේ 'සිතටත්' 'සම්ප්‍රයුක්ත ධර්මවලටත්' 'ආරම්මණ ප්‍රත්‍යයෙන්' 'ප්‍රත්‍යය උනා' කියලා කියනවා. ඒ ශබ්දය තිබුනේ නැත්නම් මේ චෛතසික ධර්ම පහළ වෙන්නේ නෑ. ඒ ශබ්දය තව එකකට ආරම්මණයක් වෙමින් ඇතිවෙමින් නැතිවෙමින් පවතිනවා.

අපි හිතමු දක්ෂිණ ධ්‍රැවයේ Antarctica පැත්තට අකුණු ගහමින් වහිනවා කියලා. නමුත් කවුරුවත් නෑ. හෙන හඬත් තියෙනවා. නමුත් සෝත විඤ්ඤාණ පහළ වෙන්නේ නැහැ. ඇයි? කනක් ඒ හරියේ නැති නිසා. යම්කිසි විදියකින්වත් ඔය හෙණ හඬ පත්තුවෙන වෙලාවේ හොඳට නිරෝගීමත් කනකුත් එක්ක මනුස්සයෙක් කිට්ටුවක හිටියොත් එහෙම මොකද වෙන්නේ? ආන්න ඒ වෙලාවට ඒ 'සද්දය' ඒ 'හිතේ' ස්පර්ශය හදන්න සහ චිත්ත චෛතසික ධර්මයන් පහළ කරන්න උපකාර වෙනවා. ඒක නිසා ඒකට මෙහෙම කියනවා.

'සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො'

ශබ්දයේ ගති ස්වභායක් තිබෙනවා කනක් හරහා ගිහිල්ලා හිතකට අරමුණු වෙන්න.

<u>ගන්ධායතනය</u>



ඊළඟට තිබෙනවා ගන්ධායතනය. ගන්ධායතනය කියන්නේ මොකක්ද? ඉහත සඳහන් රූපයේ පෙනෙන අයුරු කෙනෙකුට Perfume බෝතලේකින් විහිදෙන සුවඳක් නහයට වැදෙනවා. මෙහෙම නහයට වැදුනට පස්සේ මෙයාට මොකද වෙන්නේ? එයාට **'ඝාන විඤ්ඤාණ ධාතුව'** සමග **'ඵස්ස' 'වේදනා' 'සංඥා' 'චේතනා' 'ඒකාග්‍රතා' 'ජීවිතේන්ද්‍රිය' 'මනසිකාරය'** කියන චෛතසික ධර්ම 7 පහළ වෙනවා. (සිත + චෛතසික 7 = ධර්මතා 8). එයාගේ හිතේ මේ ධර්මතා 8 පහළ කරන්න අර බෝතලේ තිබෙන සුවඳ හේතු වෙනවා. ඔය සුවඳ කියන එක පෙනුනේ නැතුවට අපේ හිත පත්තු කරවනවා. ඒක නිසා සුවඳේ තිබෙනවා අරමුණක් හැටියට ඉදිරිපත් වීමේ යම්කිසි හැකියා ගුණයක්. කොහේ හරි නාසයක ඇතිල්ලිලා ඒ මනුස්සයාගේ හිතේ චෛතසික ටිකක් සහ හිතක් පහළ කරන්ට උපකාර වීමේ ගතියක් මේ සුවඳට තිබෙනවා. (මූලික වීමේ ගතියක් නොවෙයි, උපකාර වීමේ ගතියක්). ඒකට කියනවා **'ආරම්මණ ප්‍රත්‍යය'** කියලා. ඒක නිසා ඒකට කියනවා

'ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො'.

<u>රසායතනය</u>



ඉහත ඇති රූපයෙහි පෙනෙන ආකාරයට කිසියම් කෙනෙක් රස කැවිලි වර්ගයක් ආහාරයට ගන්නවා. මෙහි තිබෙනවා පඨවි - ආපෝ - තේජෝ - වායෝ <u>නොවෙන</u> **'රස ධාතු'** නම් වූ විශේෂ ධාතු ස්වභාවයක්. එය වර්ණයත් නෙමෙයි. ගන්ධයත් නොවෙයි. නමුත් ඒ හයටත් වඩා ඕජාවටත් වඩා වෙනස් වෙච්ච, වෙනස්ම වූ ස්වරූපයකින් පවතින්නාවූ ධර්මයක්. ඒ තමයි 'රස ගතිය'. ඒ 'රස' සමහර ඒවගේ වැඩියෙන් දැනෙනවා. සමහර ඒවගේ අඩුවෙන් දැනෙනවා. ඒ රස ධාතුව කෙනෙකුගේ දිවක හැපුනොත් දිවෙහි තිබෙනවා රසය හඳුනා ගන්න, රසයට ඉඩ දෙන ස්වභාවයක්. ඒ දිව නිසා දැන් මේ කෙනාගේ හිතේ **'ඵස්ස'** **'වේදනා'** **'සංඥා'** **'චේතනා'** **'ඒකාග්‍රතා'** **'ජීවිතේන්ද්‍රිය'** **'මනසිකාරය'** කියන චෛතසික 7 පහළ වෙනවා. මේ චෛතසික හතෙන් තමයි එයා ඒ අරමුණ හඳුනාගන්නේ. ඒ අරමුණේ තිබෙනවා මේ පැත්තක ඉන්න මනුස්සයාගේ දිවේ හැප්පිලා, මේ මනුස්සයාගේ හිතෙන් ඒ රසය ගැන හිතවන ගතියක්. ඒ රසය විඳින්න, ඒ රසය සම්බන්ධයෙන් සිත් ටිකක් සහ චෛතසික ටිකක් පත්තු කරලා අවුලලා දාන ගතියක් ඒ අරමුණේ තිබෙනවා. ඒකට කියනවා

'රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො'.

<u>ඵොට්ඨබ්බධාතු</u>



මනුස්සයෙක් වාඩිවෙලා ඉන්නවා පුටුවක. පුටුවේ තිබෙනවා එක්තරා පහසක්. එකක් තමයි 'රස්නය'. අනිත් එක තමයි පඨවි ගතිය (soft ගතිය). තවත් තිබෙනවා bounce වෙන ගතියක්. ඒ තමයි වායෝ ස්වභාවය. දැන් මේ පුටුවේ තිබෙන පඨවි ගතිය, වායෝ ගතිය, රස්නේ ගතිය කියන ගති තුනටම පොදුවේ **'පොට්ඨබ්බ'** යන නම භාවිතා කරනවා.

- පඨවි ගතිය
- වායෝ ගතිය
- රස්නය

} පොට්ඨබ්බ

දැන් මේ කෙනා පොට්ඨබ්බය යනුවෙන් එක්කෝ රස්නය එක්කෝ පඨවි ස්වභාවය හෝ වායෝ ස්වභාවය විඳිනවා. එතකොට එයාගේ හිතේ **'ඵස්ස'** **'වේදනා'** **'සංඥා'** **'චේතනා'** **'ඒකාග්‍රතා'** **'ජීවිතේන්ද්‍රිය'** **'මනසිකාරය'** යන සම්ප්‍රයුක්ත ධර්ම 7 පහළ වෙනවා. මේ රස්නයට, මේ පඨවි ධාතුවට, මේ වායෝ ධාතුවට යම් හැකියාවක් තිබෙනවා කාගේ හරි ඇඟේ ඇතිල්ලිලා ඒ ඇඟ අයිති කාරයාගේ හිතේ **'කාය විඤ්ඤාණයකුයි'** ඒකට ගැලපෙන **චෛතසික ධර්ම** ටිකකුයි මතු කරලා, උලුප්පවලා අරමුණු කරවීමට. ඒක නිසා කියනවා

'ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො'.

දැන් නැවතත් අපි මේ ටික සජ්ඣායනා කරමු.

'ආරම්මණපච්චයොති – රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො'.

දැන් මෙතන විඤ්ඤාණ ධාතු කීයක් කිව්වද? විඤ්ඤාණ ධාතු 5 ක් කිව්වා. මේ ටික තමයි කුසල හෝ අකුසල වෙන්නේ. මේ විඤ්ඤාණ ධාතු වල සම්ප්‍රයුක්ත ධර්ම කීයක් තිබෙනවද? හතක් තිබෙනවා. ඒ තමයි සර්ව චිත්ත සාධාරණ චෛතසික හත.

නැවතත් බලමු - පංච ද්වාරාවජ්ජන චිත්ත වීථියක විඤ්ඤාණයට පස්සේ ඇති උනේ සම්පටිච්ඡන සිත

- විඤ්ඤාණ ධාතු
- සම්පටිච්ඡන = මනෝ ධාතු

පෙර සඳහන් වූ විඤ්ඤාණ පහෙන් රූපයක්, ශබ්දයක්, ගන්ධයක්, රසයක් හෝ සපර්ශයක් ගත්තු ගමන්ම සම්පටිච්ඡන සිත ඇවිල්ලා ඒක බාර ගන්නවා. ඒ බාර දීමත් එක්කම අරමුණ බාර ගත්තු විඤ්ඤාණය නැතිවෙලා යනවා. මේ 'සිත' පස් තැනකින් පැමිණෙන අරමුණු බාර ගන්නවා. ඇහෙන් ආවනම් **'රූපායතනය'**, කනෙන් ආවනම් **'සද්දායතනය'**, නාසයෙන් ආවානම් **'ගන්ධායතනය'**, දිවෙන් ආවනම් **'රසායතනය'**, කයෙන් ආවානම් **'ඵොට්ඨබ්බායතනය'**. ඒ ඒ අරමුණට අදාළ දොරටුවෙන් ඇවිල්ලා ඊළඟට මේවා පැවරෙන්නේ සම්පටිච්ඡන සිතට. 'මෙන්න මම ශබ්දයක් අරගෙන ආව අහගන්න' - 'මෙන්න මම රූපයක් අරගෙන ආව මෙන්න' කියල පැවරෙන්නේ 'සම්පටිච්ඡන' සිතට = (මනෝ ධාතුව) 'සම්පටිච්ඡනය' ඒවා භාර ගන්නවා. ඒක නිසා කියනවා **'රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච**

ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො' = 'රූපායතනය සද්දායතනය ගන්ධායතනය රසායතනය ඵොට්ඨබ්බායතනය - මනෝධාතුවටත් ඒ මනෝධාතුව සමග ඉන්න චෛතසික ධර්ම සමූහයටත් ආරම්මණ ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා'.

මම ඉස්සෙල්ලා දීලා ඇති චිත්ත වීථි chart එකක්. ඒක බලන්න.

'සම්පටිච්ඡන' සිතට කියන අනිත් නම තමයි **'මනෝධාතුව'**. මනෝ ධාතුව ඇතුලේ චෛතසික කීයක් තියෙනවද? චෛතසික තිබෙනවා 10

ඵස්ස - වේදනා - සංඥා - චේතනා - ඒකාග්‍රතා - ජීවිතඉන්ද්‍රිය - මනසිකාර - විතක්ක - විචාර - අධිමොක්ඛ යන චෛතසික 10 යට කියනවා **'සම්ප්‍රයුක්ත ධර්ම'** කියලා. ඔක්කොම ධර්ම තිබෙනවා 11. (චෛතසික 10 + සිත = 11). මේ ධර්ම 11 හැදෙන්න චක්ඛු විඤ්ඤාණයෙන් ගත්තු ඒ අරමුණ මේ 'මනෝධාතුව' කියන 'සම්පටිච්ඡනයට' භාර දුන්නයින් පස්සේ අරමුණක් හැටියට යම් කිසි ඒත්තු ගැන්වීමක් තියෙනවා. යම්කිසි අරමුණු වීමක් තියෙනවා.

<u>ප්‍රශ්නය</u> - මේ සිතට උදාහරණයක් දෙන්න පුලුවන්ද?

<u>පිළිතුර</u> - මේක වෙන්නේ මෙහෙමයි. අපි ෆොටෝ ගන්නවා. එතකොට ඒ කැමරාව යම් කිසි සටහනක් capture කරනවා. ඊට පස්සේ ඒ capture කරපු දේ අල්ලාගෙන තව තැනක රඳවා ගන්නවා. ඒ ක්‍රියාවට ඇතුලේ තිබෙන features ටිකක් අවශ්‍යයයි. සමහර වෙලාවට තිබෙනවා computer එකේ cut and paste කරනවා කියලා දෙයක්. ඒ කියන්නේ එක තැනකින් අරගෙන තව තැනක අලවලා දමනවා. ඒ වගේ චක්ඛු විඤ්ඤාණයෙන් ගත්ත අරමුණම තමයි මනෝ ධාතුව කියන එක තව චෛතසික ධර්ම තුනකුත් වැඩිපුර දාගෙන බාර ගන්නේ. ගෙදරට ආපු එක්කෙනා ඇතුලට එනකොට 'එන්න අයියේ' 'එන්න අක්කේ' කියලා අතින් ඇදලා ගන්න ගතියක් තියෙනවා නේද? පිළිගන්න කොට එහෙම නේද? අන්න ඒවගේ 'විතර්ක' 'විචාර' 'අධිමොක්ඛ' යන චෛසික තුනත් එක්ක ඉස්සෙල්ලට වඩා වැඩියෙන් ඒ අරමුණ පිළිගන්න ගතියක් තිබෙනවා. ඒ ගෙදරට ආපු කෙනාට වාඩි වෙන්න කියලත් අපි කියනවා. දැන් එයා පුටුවේ වාඩිවෙලා

ඉන්නවා. ඒවගේ දෙයක් තමයි මනෝධාතුව කළේ. මනෝධාතුව පිළිගත්තා. ඒක නිසා කියනවා **'රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො'** කියලා.

මේ අවස්ථාවේදී මනෝ ධාතුව භාර ගන්නේ චක්ඛු විඤ්ඤාණයෙන් අරන් දීපු රූපයමයි. චක්ඛු විඤ්ඤාණය තමයි ඉස්සෙල්ලාම ගිහිල්ලා එළියේ තිබෙන රූපය ගන්නේ. චක්ඛු විඤ්ඤාණය අරගත්තු ඒ රූපය තමයි මනෝ ධාතුව භාර ගන්නේ (සම්පටිච්ඡන සිත).

ඊළඟට අපි හිතමු, දැන් ගෙදරට කෙනෙක් ආව. අපේ අයිය අක්ක වගේ කියලා වාඩි වෙන්නත් කියල කිව්වා. ඊළඟට තිබෙනවා 'සන්තීරණ' කියලා හිතක්. මේ සන්තීරණ සිතට දීපු නම තමයි **'මනෝ විඤ්ඤාණ ධාතු'**. මේ සන්තීරණ සිතෙන් කරන්නේ, අර ගේ ඇතුලට භාර ගත්තු එක්කෙනා ඇත්තටම අපේ අක්කද කියලා විපරම් කරලා බලනවා වගේ හිතට ගත්තු අරමුණ හොඳට විපරම් කරලා බලන එක. ඒක නිසා **'මනෝ විඤ්ඤාණ ධාතුවට'** වැඩ වැඩියි. ක්‍රියා කාරී ගතිය ටිකක් වැඩි වෙනවා.

1. **විඤ්ඤාණ ධාතුව** රූපයක් ගත්තා. ඒක භාර දුන්නා **සම්පටිච්ඡනයට** (මනෝ ධාතුවට).

2. සම්පටිච්ඡනය ඒ අරමුණ භාර ගෙන ඇතුලට කැන්දාගෙන ගියා. දැන් **සන්තීරණ** හිතෙන් (මනෝ විඤ්ඤාණ ධාතු) කරන්නේ හොඳට විමසා බැලීම. 'ගෙට ගත්තු කෙනා ඇත්තටම අපේ අයියාද, අක්කාද' කියලා විමසා බලනවා වගේ සන්තීරණ සිත ඒ අරමුණ පිළිබඳව හොඳට විමසා බලනවා.

3. ඊළඟට තිබෙන්නේ **වොත්ථපන** සිත, ඒකත් මනෝ විඤ්ඤාණ ධාතුවක්. ගේ ඇතුලට පැමිණි අමුත්තා හරියටම අපේ අක්කා කියල තීරණය කරනවා වගේ වොත්ථපන සිත සම්පටිච්ඡන සිතෙන් විමසූ ඒ අරමුණ ඒ විදියටම තීරණය කරනවා.

4. ඊට පස්සේ තිබෙන්නේ **ජවන් 7** ක්. ඒ සියල්ලමත් මනෝ විඤ්ඤාණ ධාතු. අක්කා ගෙනාපු බෑග් අදිනවා වගේ ජවන් සිත් වලින් ඒ ගත්තු අරමුණේ රසය විඳිනවා.

'සබ්බෙ ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො'.

විඤ්ඤාණ ධාතුවට ගත්තු අරමුණයි **මනෝ ධාතුවට** ගත්තු අරමුණයි **මනෝ විඤ්ඤාණ ධාතුවට** ගත්තු අරමුණයි තුනම එකයි. එකම අරමුණ. මේ එකම අරමුණ එක පේළියකට චිත්ත චෛතසික පහළ කරන්න උපකාර වෙනවා. මේවා සත්වයෝ නෙමෙයි, පුද්ගල, ජීව, ආත්ම නොවෙයි, මේවා ධර්ම ස්වභාව.

ඊළඟට තිබෙනවා මෙහෙම. **'යං යං ධම්මං ආරබ්භ යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො'.**

'යං යං ධම්මං ආරබ්භ' = යම් යම් ධර්මයක් අරභයා

'යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති' = යම් කිසි - යම් කිසි ධර්මයෝ උපදිත්ද - ඒ උපදින ධර්මයෝ තමයි චිත්ත චෛතසික ධර්ම = **' චිත්තචෙතසිකා ධම්මා'**

'තෙ තෙ ධම්මා' = ඒ ඒ ධර්මයෝ

'තෙසං තෙසං ධම්මානං' = ඒ ඒ ධර්මයන්ට

'ආරම්මණපච්චයෙන පච්චයො' = ආරම්මණ ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි.

අපි දැන් හිතමු මෙහෙම. **'යං යං ධම්මං ආරබ්භ'** කියන තැනදී ඔක්කොම ටික ගන්නවා. දැන් බලන්න, **'යම් කිසි යම්කිසි ධර්මයක් අරමුණු කරගෙන'** කියන කොට සියලුම රූප, ශබ්ද, ගන්ධ, රස, සපර්ශ, චිත්ත චෛතසික, ආපෝ ධාතු. සූක්ෂම ධර්ම, ළඟ දුර තිබෙන දේවල්, ප්‍රඥප්ති, නිර්වාණය ඇතුළු ඔක්කොම අයිතියි.

'යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති' - දැන් උපදින්නේ මොනවාද? අරමුණක් එන කොට එය හඳුනා ගැනීමට පහළ වෙන චිත්ත චෛතසික ධර්ම.

'තෙ තෙ ධම්මා' - ඒවාට අරමුණු වන ධර්මයෝ - අරමුණු කියලා කියන්නේ නම්, ගම්, රූප, ශබ්ද, අතීත සිදුවීම්, අනාගත සිදුවීම් ආදී හැම එකක්ම.

'තෙසං තෙසං ධම්මානං' - ඒ ඒ චිත්ත - චෛතසික ධර්මයන්ට (සමහර ඒවාගේ චෛතසික ධර්ම අඩුයි, සමහර ඒවාගේ වැඩියි)

'ආරම්මණපච්චයෙන පච්චයො' - ආරම්මණ ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙයි.

දැන් අපි මෙතක් මුල ඉඳලාම කථා කළේ ආරම්මණ ප්‍රත්‍යය කුමක්දැයි කියන එක. මම දැන් කරුණු කීපයක්ම කියලා දුන්නා. ඒ තමයි **'විඤ්ඤාණ ධාතු', 'මනෝ ධාතු', 'මනෝ විඤ්ඤාණ ධාතු'.**

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස, කෑමක තිබෙන රසයි සුවඳයි පාටයි එකම වෙලාවක දැන ගන්න පුලුවන්ද?

<u>පිළිතුර</u> - එහෙම වෙන්නේ නෑ. එක මනුස්සයෙකුගේ හිතේ එක වෙලාවකට අරමුණු කරන්න පුළුවන් කම තිබෙන්නේ එක ධර්මයයි. ඒ ධර්මය අරමුණු කරලා, ඒ අරමුණත් - අරමුණු කරපු හිතත් නැතිවෙලා ගියාට පස්සේ තමයි වෙන අරමුණක් ගන්නේ. කවදාකවත් එක වෙලාවකට අරමුණු දෙකක් ගන්න බෑ. ඒක වෙන්නේ නෑ.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස මනෝ විඤ්ඤාණ ධාතු වල චෛතසික ප්‍රමාණය වැඩිද?

<u>පිළිතුර</u> - වැඩි වෙනවා, වොත්ථපන සිතෙහි ඵස්ස, වේදනා, සංඥා, චේතනා, ඒකාග්‍රතා, ජීවිතේන්ද්‍රිය, මනසිකාරය, විතක්කය, විචාරය, වීර්ය, අධිමොක්ඛය කියලා චෛතසික එකොළහක් තිබෙනවා. ජවන් සිතුත් සියල්ලම මනෝ විඤ්ඤාණ ධාතුම තමයි නමුත් ජවන් වල චෛතසික ධර්ම තවත් වැඩියි. සමහර ජවන් වල 30 + චෛතසික ධර්ම තිබෙනවා.

<u>ප්‍රශ්නයක්</u> - ඒ හැම ජවන් සිතක්ම එක හා සමානයි නේද?

<u>පිළිතුර</u> - ඔව් ඒ සියල්ලම එකම මට්ටමේ ජවන්.

<u>ප්‍රශ්නයක්</u> - විර්යය වගේ දෙයක් වොත්ථපනයේ යෙදෙන්නේ ඇයි?

<u>පිළිතුර</u> - වොත්ථපනය කියලා කියන්නේ තීරණය කරන සිතක්. යම්කිසි දෙයක් තීරණය කරනකොට එතෙන්ට ගැම්මක් අවශ්‍යයි. දැන් අපි ලියුමක් යවන්න බාර අරගෙන ඒක යවන්න ඕනේ කියලා සීල් එකක් ගහනවනේ. ඒ සීල් එක ගහන්න සීල් එකක් අවශ්‍යයි. ඒ වගේ තීරණය කරනකොට අරමුණේ හැටියට හිත ශක්තිමත් කරලා දෙන අතිරේක බලයක් එතෙන්ට වැටෙනවා. ඒකයි වීර්ය කියලා කියන්නේ. සමහර සිත් අරමුණට නිරායාසයෙන්ම යනවා විපාකයක් හැටියට. සමහර සිත් අරමුණට යනවා අතිරේක වීර්යකුත් එක්ක. දැන් 'මනසිකාරය' කියන චෛතසිකය විපාක සිත් වලත් තියෙනවා. අරමුණ ගැම්මට තියෙන කොට එතෙන්ට ඉබේටම (automatically) යනවා. අල්ලලා දීපු අරමුණ තවත් හොඳට අල්ලා ගන්න අතිරේක බලවේගයක් අවශ්‍යයි. මීටත් වඩා වීර්ය වැඩියි ජවන් සිත් වල.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස අර සම්පටිච්ඡනයේ ඉඳන් සන්තීරණයට එනකොට චෛතසික තුනක් වැඩි වෙනවනේ. විතර්ක විචාර අධිමොක්ඛය කියලා. ඒ තුනෙන් විශේෂයෙන් කරන කාර්ය මොකක්ද?

<u>පිළිතුර</u> - 'විතර්කයයි' 'විචාරයයි' කියන දෙක 'ඵස්සයයි' 'මනසිකාරයයි' එක්ක අරමුණට ගොඩවෙලා හැසිරෙන ආකාරයක් තිබෙනවා. 'අධිමොක්ඛය' කියලා කියන්නේ අරමුණ විනිශ්චය කරන, අරමුණ කෙරෙහි පැහැදීම් ගතියක් ඇතිවීම. සමහර තැන්වලදී ශ්‍රද්ධාවටත් අධිමොක්ඛය කියලා පාවිච්චි කරනවා. සමාන්‍යයෙන් තිබෙන්නේ අරමුණ හොඳයි හෝ නරකයි යනුවෙන් විනිශ්චය කරන ගතිය.

<u>ප්‍රශ්නයක්</u> - අපි අරමුණක් ගන්න කොට ආයතන දෙකක් සම්බන්ධ වෙනවා. බාහිර අභ්‍යන්තර කියලා දෙකක් තියෙනවනේ. මෙහිදී අපි රූපය ගත්තේ බාහිරෙන්. අභ්‍යන්තර ආයතනය තමයි ඇස. අපි ඒක වෙන නමකින්ද පාවිච්චි කළේ? නැත්නම් ඒක පාවිච්චි කළේ නැත්ද?

<u>පිළිතුර</u> - දැන් අපි මේ කථා කරන්නේ ආරම්මණ ප්‍රත්‍යය ගැනයි. රූපය අරමුණු වෙන්නේ හිතටද? ඇහැටද? හිතට.

ඉහත සඳහන් ආකාරයට කෙනෙකුගේ සිතෙහි 'චක්ඛු විඤ්ඤාණ ධාතු' සහ 'සම්ප්‍රයුක්ත ධර්ම' පහළ කරන්න ඔහු ඉදිරියෙන් ඇති රූපයෙහි වර්ණය උපකාර වෙනවා. ඒ 'වර්ණය' 'චක්ඛු විඤ්ඤාණය' පහළ වීමට අරමුණක් හැටියට ක්‍රියත්මක වෙනවා. ඒ රූපයේ තිබෙන 'වර්ණය' ගැනීමට ඔහුගේ 'ඇස' උදව් උනාට ඒ 'හිතට' 'ඇස' පෙන්නේ නෑ. ඔහුට පහළ වෙන හිත් වලට ඇසේ ආධාරයෙන් රූපය පෙනුනට ඒ හිත් වලට 'ඇස' පෙන්නේ නෑ. ඒක නිසා 'ආරම්මණ ප්‍රත්‍ය' ගැන කථා කිරීමේදී ආධ්‍යාත්මික ඇහැ අතහරිනවා. අපි කොච්චර බලන් හිටියත් අපිට ඇහැ පෙනෙන්නේ නෑ. කොච්චර සද්ද අහන් හිටියත් අපිට කන අරමුණු වෙන්නේ නෑ. නාසය අරමුණු වෙන්නේ නෑ, නාසයට දැනෙන ගන්ධය අරමුණු වෙනවා. දිව අරමුණු වෙන්නේ නෑ, දිවට දැනෙන රස අරමුණු වෙනවා. කය අරමුණු වෙන්නේ නෑ, කයට දැනෙන ස්පර්ශ අරමුණු වෙනවා. එක නිසා 'ආරම්මණ ප්‍රත්‍යයයේදී' ආධ්‍යාත්මික ආයතනය සියල්ලම අතහරිනවා.

<u>ප්‍රශ්නයක්</u> - ස්වාමීන්වහන්ස දැන් 'ඇහැයි' 'චක්ඛායතනයයි' කියලා දෙකක් තියෙනවනේ. ධර්මයේදී ගන්නේ ඒ දෙකම එකක් කියලද නැත්නම් දෙකක් කියලද?

<u>පිළිතුර</u> - කියන්න බලන්න වචන කියක් තියෙනවද ඇහැට දාලා? චක්ඛු ඉන්ද්‍රිය කියනවා. චක්ඛායතනය කියනවා. චක්ඛු ද්වාරය කියනවා. චක්ඛු

ප්‍රසාදය කියල කියනවා. එක ධර්මයක එක ලක්ෂණයක් විතරක් නෙමෙයි තියෙන්නේ. එක ධර්මයක ක්‍රියා කාරී ස්වභාව ගොඩක් තියෙනවා. සමහර විට හතරක් තිබෙනවා. සමහර විට 5 ක් 6 ක් 7ක් හෝ තියෙන්න පුළුවන්. ඒවගේ චක්ඛු වස්තුවෙත් ක්‍රියා කාරී ස්වභාව ගොඩක් තියෙනවා. ඒක අපි සරල උදාහරණයක් වශයෙන් ගත්තොත් වතුර වල හැකියාවන් කීපයක්ම තිබෙනවා.

- පිපාසය නිවන ගතිය
- සෝදන ගතිය
- සිසිල් වෙන ගතිය
- බදාම ඇනීම (පිටි ඇනීම)
- ගිනි නිවීම
- ගස් වලට දැමීම
- රිදවීම

දැන් බලන්න වතුර වල ගති කීපයක් තිබෙනවානේ. අන්න ඒ වගේ එක ධර්මයක තිබෙනවා යම්කිසි දෙයකට උපකාරවීම් ස්වරූප කීපයක්.



ඒවගේම ඇහැ කියන එකෙත් තිබෙනවා,

- අරමුණු වලට හිතට එන්න දෙන නිසාත් හිත අරමුණට යන නිසාත් ඒකට කියනවා 'දොරටුව' කියලා.
- චක්ඛු විඤ්ඤාණය සහ සම්ප්‍රයුක්ත ධර්ම 7 වැඩ කරන වෙලාවට කනට, දිවට, ශරීරයට හෝ වෙන කිසිම සිතකට එන්න දෙන්නෙ නැති නිසාත් ඒ වෙලාවට අනිත් අය යටපත් කරගෙන චක්ඛුව රජෙක් වගේ ඉන්න නිසාත් කියනවා 'චක්ඛු ඉන්ද්‍රිය' කියලා.
- ඇසේ තිබෙනවා වර්ණ රූපය ඇතිල්ලෙන, ස්පර්ශ වෙන තැවරෙන ගතියක්. ඒකට කියනවා 'ප්‍රසාද ගතිය' කියලා.
- චිත්ත චෛතසික ධර්මයන් හදන්න උපකාර වෙන නිසාත් ඒ හරහා කෙලෙසුත් හදලා දෙන්න උපකාර වෙන නිසාත් කියනවා 'ආයතනය' කියලා.

- ජීවයක් සත්වයෙක් පුද්ගලයෙක් නොවෙන නිසා කියනවා ‘ධාතු’ කියලා.

ඔන්න ඔය විදියට එක දේක ක්‍රියා කාරී ස්වරූප ගොඩක් තිබෙනවා. ඒ අනුව තමයි නම් දීලා තිබෙන්නේ. අපි දැන ගන්න ඕනේ ඒ වෙලාවට පාවිච්චි කරන්නේ මොන නමද කියලා.

දැන් දොස්තර මහත්මයෙක් ඉන්නවා. එයා විවාහ වෙලා. ළමයි ඉන්නවා තුන් හතර දෙනෙක්. ළමයි කියන්නේ තාත්තා කියලා. Clinic එකට ගියාට පස්සේ දොස්තර මහත්තයා කියනවා. ඒ පොඩි ළමයින්ට යාළුවො ඉන්නවා. පොඩි ළමයි අසනීප වෙනවා. ඒ පොඩි ළමයි දොස්තර ගාවට යනවා. ගිහිල්ලා කියනවා ‘තාත්තේ මට අසනීපයි බෙහෙත් ටිකක් දෙන්න’ කියලා. ඒ පොඩි ළමයින්ගේ යාළුවොත් අසනීප වෙනවා. ඒගොල්ලන්ටත් කියන්නේ පුළුවන්ද ‘තාත්තේ මට බෙහෙත් ටිකක් දෙන්න කියල? බෑ. ඒ ‘තාත්ත’ කියන නම අයිති වෙන්නේ දොස්තර මහත්තයගේ ළමයින්ට විතරයි. අනිත් ළමයි කියන්න ඕනේ දොස්තර මහත්තය කියලා. දැන් තේරුණා නේද? ඒක නිසා මේ වචන තිබුනට ඒවා පාවිච්චි කරන තැන් තිබෙනවා. අපිට මේව අහල අහල තේරුම් ගත්තයින් පස්සේ තමයි වැටහෙන්නේ කොයි අවස්ථාවේදීද ඒකට සුදුසු නම පාවිච්චි කරන්න ඕනේ කියලා.

<u>ප්‍රශ්නයකට දෙන පිළිතුරක්</u>

සතිපට්ඨාන සූත්‍රයේ හරි සච්චවිභංග සූත්‍රයේ හරි බලන්න **‘කතමා චාවුසො, ජාති’?** කියන තැන.

‘යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො, අයං වුච්චතාවුසො – ‘ජාති’’.

ආයතනං කියල කියන්නේ එක ආයතනයක් කියන එකයි. නමුත් මෙතන තිබෙන්නේ **ආයතනානං** කියලා. මේක බහු වචනය. **‘ආයතනානං පටිලාභො’** කියලා කියන්නේ **‘ආයතනයන්ගේ ලැබීම’** කියන එකයි. චක්ඛායත්නය, සෝතායතනය ගන්ධායතනය ජිව්හායතනය ඇතුළු ඔක්කෝම ආයතන ටිකට තමයි බහු වචනයෙක් **ආයතනානං** කියලා තියෙන්නේ. හැබැයි ඒක බහු වචනයෙන් තිබුනට අපි උපදින වෙලාවේ

ධර්මතා තුනක් පහළ වෙනවා. එකක් තමයි ප්‍රතිසන්ධි හිත. මේ සිතත් එක්ක පහළ වෙනවා රූප තුනක්. ඒ තුන තමයි 'කාය' 'භාව' සහ 'වත්ථු'. වත්ථු රූපය ආශ්‍රය කරගෙන තමයි 'මනස' පවතින්නේ. කය නමැති රූපය ලොකු උනාට පස්සේ කය වැඩිලා යනකොට ඒ කයට ස්පර්ශ වෙනවා. ඒක නිසා එතනත් තිබෙනවා ධර්මතා දෙකක් (මනස සහ කය). තව ටිකක් ඉස්සරහට වැඩීගෙන යනකොට චක්ඛු, සෝත, ඝාන, ජිව්හා යන ආයතන පහළ වෙනවා. 'කය' ඉස්සෙල්ලා පහළ උනා. මෙසේ සිදුවෙන්නේ මනුෂ්‍ය ලෝකයේ.

ඕපපාතික සත්වයන්ගේ ආයතන 6 ම එකට පහළ වෙනවා. ඔය බහු වචනයෙන් කියලා තිබෙන්නේ ඒ නිසයි.

තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය භන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි